ආග්නියා බාර්ලෝ

පොඩි නංගී

පොඩි නංගී

මගෙ චුට්ටං නංගියාට,
ආදරයෙන් මම ඉන්නේ,
ඈට ගහන්නට බණින්න,
කොහොමත් නෑ ඉඩදෙන්නේ!

සෙල්ලම් බඩු උදුරගන්න,
කොණ්ඩෙන් ඇදලා දුවන්න,
හිතුනොත් මේවාගේ වැඩ,
මමයි කරන්නේ!

සායම් ගෑම

මඩුවේ සායම් ගාන්න - සීයා මට කතා කළා.
මේ වාගේ වැඩ කරන්න - මා නම් හරි සූරයා.

පාන්දරින් තේ බීලා - සායම් ටින් එල්ලාගෙන,
මඩුව ළඟට ගිහින් අපේ - වැඩේ පටන් ගත්තා.

"ඔහොම නොවෙයි, ඔහොම නොවෙයි!
ඇයි මේ හැටි කලබොලයක්?"
හැම වේලෙම සීයා මට
උපදෙස් දුන්නා.

කළු පාටට පාසි බැඳුන,
ලෑලි හොඳට සූරන හැටි,
නිතරම මා ළඟට ඇවිත්
කියලා දුන්නා.

සායම් භාජනේ අරන්,
බුරුසුව එහි පොඟවාගෙන,
උඩ පහළට හරස් අතට
සායම් ගෑවා.



ටික වේලාවක් යනකොට,
ඉසේ ඉඳන් දෙපා ළඟට,
සායම්වල එබුව වගේ
මාව දිස් වුණා.

සායම් ගෑමත් හරි ලොකු,
වැඩක් වගෙයි සිතා ඉන්නෙ,
මේ වාගේ සුළු දේවල්,
මට හරි ලේසියි.

හරක් සෙල්ලම

ඊයේ අපි පන්තියේදි,
අලුත්ම සෙල්ලමක් කළා.
ගාල ලිහල දැම්ම වගේ,
පැන පැන දිව්වා.

ගොනුන් වගේ තප්පුලමින්,
"උම්බෑ-උම්බෑ" කියමින්,
බංකු මේස පෙරළාගෙන,
සෙල්ලම් කෙරුවා.

තව සමහරු ගොනුන් පස්සෙ,
එළවන බල්ලන් වාගේ,
"බව්-බව්" කියමින් පසු පස,
දුවන්නට වුණා.

ගුරුතුමියට තරහ ගිහින්,
"මේ වාගේ නරක ළමයි,
කොහෙවත් දැක්කේ නැහැ" යයි,
කියන්නට වුණා.

"මෙතන කොහෙද ළමයි ඉන්නෙ?
සේරම හරකුයි, බල්ලොයි,
සතුන්ට තේරෙන්නේ නැහැ!"
උත්තර දුන්නා.

"දඩාවතේ යන හන්දා,
මේ සේරම වට කරගෙන,
උදේ හිටන් රෑ වන තුරු,
බුරන්ට ඕනෑ!"

"ඔය සේරම හරකුන් නම්,
මා උන් දක්කන මිනිහා!"
ගුරුතුමි කෝටුව අරගෙන
අපව එළෙව්වා!



බලු පැටියා

හොඳට රසට කවල පොවල,
සෑමදාම දිය නාවල,
හොඳ රස්නෙට නිදි කරවල,
බලු පැටියෙකු හැදුවා.

ඌ ලොකුවන හැටි බලන්න,
රෑට ඇඳෙන් බැහැල ඇවිත්,
උගෙ සීතල පුංචි නහය,
අල්ලල බැලුවා.

මෙහෙම ටික කලක් යනකොට
ඌ හොඳටම හීලැ වුණා.
අපි යන එන හැම තැනටම,
ඌත් ගෙන ගියා.

ලිප ළඟ රෑ ගිනි තපින්ට,
වේලාවට කෑම කන්ට,
එළිපත්තේ නිදියන්නට,
හොඳටම පුරුදුයි.

දවසක් දා හිමිදිරියේ
ලොරියක බඩු පටවාගෙන
අපි සේරම අලුත් ගෙයක,
පදිංචියට ගියා.

බලු පැටියා වෙනදා මෙන්,
පාන්දරින් අවදි වෙලා,
උදේම සෙල්ලම් කරන්න,
එළියට බැස්සා.

අහළ පහළ කවුරුත් නැහැ,
බලු පැටියට හරිම දුකයි,
පාළු ගෙදර තනිවුණු බව,
ඌට තේරුණා.

වත්ත පහළ පඳුරුවලට,
දහවල් වනතුරු බුරලා,
බඩගින්නේ මහන්සියෙන්,
එහිම වැතුරුණා.

අතර මඟදි හිටි හැටියේ,
බලු පැටියා මතක් වෙලා,
ඌ ගෙනයන්නට ලොරියෙන්,
ආපසු ආවා.

බලු පැටියා හරි සතුටින්,
දුවගෙන විත් තුරුළට පැන,
ආදරයෙන් අපේ මුහුණු,
ඌ ලෙවකෑවා!.

මුර බල්ලා

ඉඳගෙන ඉඳලා හරිම මහන්සියි
කකුලුත් හිරි වැටිලා.
මම නම් ආසයි දවස ගෙවන්නට,
ගේ දොර මුර කරලා!

මෙන්න බොලේ මේ ගේට්ටු කණුවේ,
දැන්වීමක් ගහලා!
'රෑට ගෙදරදොර බලාගන්ට හොඳ,
මුර බල්ලෙකු ඉල්ලා!'

කිසි කෙනෙකුට මම බය වෙන්නේ නෑ
මම හරි වීර පුතෙක්!
ඕනැම තැනකදි සටනට යනවා,
මම හරි සූර පුතෙක්!

එක සැරයක් මං හයියෙන් බිරුවොත්,
මුළු පෙදෙසම සෙලවෙනවා.
ඒවාගෙම සතුරා මිතුරාගෙන්,
වෙන්කර හඳුනනවා.

බළල් පැටව්, කුකුළෝ, මීයෝ,
මා දැක වෙව්ලනවා.
මේවගෙ අමාරු වැඩට පලට,
මා නම් ගැළපෙනවා.



උදෑසන

තුරුවැල් පිබිදෙන - පිනිබිඳු දිලිසෙන,
මේ අලුයම් කාලේ.

කොළ අතු සිපගෙන - 'සිරි සිරි' හඬදෙන,
මේ සීතල සුළඟේ.

හරිම පියකරුයි - හරිම පිරිසිදුයි,
මේ හිමිදිරි උදයේ.

බෝලය අරගෙන - දුව යන්නෙමි මම,
මේ තණ පිට්ටනියේ.



මුනුපුරෝ හතළිස් දෙනා

වත්ත පහළ වැට අද්දර,
වෙරළු ගහේ අත්තක් උඩ,
ගිරව් ජෝඩුවක් ඇවිදින්,
කූඩුව හදලා!

"අනේ දෙයියනේ මේකත්,
හරිම ගිරහ අපලයක්නෙ!
වෙරළු ගහේ අවසානේ!"
නැන්ද කියනවා

මුන් එළවාගන්ට යමක්,
දැන්ම කරන්නට ඕනෑ!
මගෙ මුනුපුරො හතළිස්දෙන,
ගෙන්වන්නට ඕනෑ!



ගල්, පොලු, දඬු මුගුරු අරන්,
මුනුපුරො හතළිහ ආවා.
ගස වටකර එල්ල බලා,
සටන ඇරඹුවා!

ටික වේලාවක් ගිය පසු,
සියල්ලෝම හෙම්බත් වී,
ගිරා කූඩුවේ වගතුග,
විපරම් කෙරුවා.

මල්, කොළ, ගෙඩි එකක් නැතේ!
කූඩුව යස රඟට ඇතේ!
නැන්දා තරහෙන් හැමදෙන,
එළවා ගත්තා.

ආග්නියා බාර්ලෝ

පොඩි නංගි

චිත්‍ර
විතාලි ගර්යායෙව්

අනුවාදය
දයා අබේසේකර

ISBN 978-955-1979-24-7

ප්‍රකාශනය

කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
යස ඉසුරු ප්‍රින්ටර්ස්

ප්‍රථම මුද්‍රණය 2015

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-24-9

Rs. 125/-

9 789551 979249